# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1656/4 - 2010 මැයි 31 වැනි සඳුදා - 2010.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත

14 වැනි වගන්තිය යටතේ නියෝග

වැඩබලන කර්මාන්ත හා වාණිජ අමාත්‍ය, ජයරත්න හේරත් වන මම, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2010 ජුනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, මෙහි උපලේඛනයේ III වැනි තීරුවේ දක්වා ඇති භාණ්ඩ මත ආනයනය කරන අවස්ථාවේ තීරු බදු කාර්යය සඳහා සලකන වටිනාකමට, එම වටිනාකමෙන් සියයට දහයක (10%) ක අගයක් එකතු කළ විට ලැබෙන සමස්ත වටිනාකම මත, එකී උපලේඛනයේ IV වැනි තීරුවේ ඒ සඳහා දක්වා ඇති අදාළ අනුපාතයන් පරිදි, සෙස් බද්දක් නියම කොට අය කර ගත යුතු බව මෙම නියෝගය මගින් ප්‍රකාශයට පත් කරමි.

එසේ වුව ද —

1. මෙම උපලේඛනයේ IV වැනි තීරුවේ එකකට වඩා වූ බදු අනුපාතිකයන් දක්වා ඇති විට, ගෙවිය යුතු සෙස් බද්ද ගණනය කිරීමේ දී අදාළ වන අනුපාතය වනුයේ, සෙස් බද්ද වශයෙන් වැඩි මුදලක් ගෙවිය යුතු වන අනුපාතය යි.

2. මෙමගින් පනවනු ලබන සෙස් බද්ද පහත අවස්ථාවන්හි දී අදාළ නොවේ :–

   (i) භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියට යටත් ව ආනයනය කරන ලද (විලවුන් පිළියෙල කිරීම නොවන) ආයුර්වේද, යුනානි සහ සිද්ධ පිළියෙල කිරීම් සහ ආයුර්වේද සිද්ධ සහ යුනානි වෛද්‍ය ක්‍රම සඳහා උපයෝගී කරගනු ලබන හා එසේ උපයෝගී කරගනු ලබන බවට තත්කාලීන ආයුර්වේද විෂයය අයත්වන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුදැනුම ඇතිව රෙගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයක් මගින් නිශ්චය කොට දක්වා ඇති සැකසූ හා නොසැකසූ ඖෂධ වර්ග සහ බෙහෙත් පැළෑටි ;

   (ii) විලවුන් උපකරණ සහ ඖෂධ පනත යටතේ ඖෂධ ලෙස හෝ උපකරණ ලෙස ලියාපදිංචි වී ඇති යම් නිෂ්පාදිතයක් හෝ පිළියෙල කිරීමක් ;

   (iii) කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත ආනයනය කරනු ලබන විලාසිතා, ස්වර්ණාභරණ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය, අන්තර් භාණ්ඩ, කොටස් හා උපාංග සහ ඇසිරීම සඳහා ගන්නා ඇසුරුම් බඳුන්'.

1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය යටතේ පනවන ලදුව, 2009.01.30 වැනි දිනැති අංක 1586/26 දරන *ගැසට් නිවේදනය*, 2009.02.20 වැනි දිනැති අංක 1589/31 දරන *ගැසට් නිවේදනය* සහ 2009.07.31 වැනි දිනැති අංක 1612/31 දරන *ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශිත නියෝග මෙමගින් අවලංගු කරමි.

ජයරත්න හේරත්,  
වැඩබලන කර්මාන්ත හා වාණිජ අමාත්‍ය,

2010 මැයි මස 31 වැනි දින,  
කොළඹ,  
කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයේ දී ය.

1A - G 12930 — 1,160 (2010/05)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.